
ලංකාවිත්ති
LANKA VITHTHI

**LANKA VITHTHI**
**P.O.BOX 14373**
**LONDON NW6 3WU**
**ENGLAND**

*Phone & Fax* : **020 7428 9388**
E-mail : **lanka.viththi @ virgin.net**

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : **Daya Ananda Ranasinghe**

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam



# කොටි තහනම් කරන්නේ කවදා ද?

**ඉ**හතකි ප්‍රශ්නය මම ලංකාවේ සිට පැමිණි මා හොඳින් හඳුනන මාධ්‍යවේදියෙකුගෙන් ඇසුවෙමි. ඔහු ගත් කටටම දුන් පිළිතුර වූයේ " දැනටම කොටි සංවිධානය තහනම් කරපු එකක් නේ. එංගලන්තෙ ඇමරිකාව කැනඩාව ඇතුලු රටවල් ගණනකම තහනම් කරලා නේ තියෙන්නේ... ඇයි දන්නෙ නැද්ද? " යන්නයි.

" ඒක මම දන්නවා " මම කිවෙමි. " මං මේ අහන්නේ ලංකාවෙ ඒක තහනම් කරන්නෙ කවදද? කොටිත්‍රස්තවාදෙ තියෙන්නෙ ලංකාවෙනේ.. එහේ නේ ඒක ඉස්සෙල්ලාම තහනම් කරන්න ඕන.... කවද ද කොටින්ව ලංකාවෙ තහනම් කරන්නෙ?..." ඔහු අපහසුවෙන් ඇඹරුණේය.

" අනේ ඒක නම් මං දන්නෙ නෑ...." ඔහු අවංකවම කීවේය. " මං දන්නවා මුලු ලෝකෙම අහන ප්‍රශ්නයක් ඕක. ඒත් තවම ඕකට දෙන්න හරි පිළිතුරක් අපේ රටේ කාගෙවත් ළඟ නෑ."

මෙම අවුල තේරුම් ගන්නට නම් ලංකාවේ වාසය කරන මිනිසුන්ගේ ඔලුව වැඩකරන හැටි මඳක් සිතා බැලිය යුතු ය. අනුමාන වශයෙන් අපට සිතාගත හැක්කේ මෙය ය.

ලංකාවට කිසිදු නිශ්චිත අරමුණක් නැත. සැලැස්මක් නැත. ඉදිරි ඉලක්කයක් නැත. එහි කෙරෙන්නේ දෛනික ජීවත්වීමකි. එදා දවසට හරියන යමක් කර, ඉතිරි ටික කරන්නේ හෙට ය. හෙට කවුරු හරි අතිපණ්ඩිතයෙක් ලණුවක් දුන්නොත් අර කරගෙන ආ දෙය වෙනස් කර අර ලණුව ගිලී. අනිද්දා සම්පූර්ණයෙන් තවත් අලුත්ම දෙයකට අත ගසයි. මේ ආකාරයෙන් ලංකාවේ මේ මෑත භාගයේ පටන්ගත් සියලුම දේවල් කෙළවර කර ඇත්තේ සම්පූර්ණයෙන්ම නිශ්ප්‍රයෝජන ව්‍යසන වලිනි.

ලංකාව ජීවත්වන්නේ ලෝකයා කියන විදියටය. ලෝකයාගෙන් ඔපීනියන් ගනී. ඒ නිසා ලෝකයා ඇවිත් ලංකාවේ හැම දේටම ඇඟිලි ගසයි. ලංකාව කරබාගෙන ඉඳී. කොටි ත්‍රස්තවාදීන් දැන් දවසගානේ කොළඹ හා අනෙක් සිංහළ පළාත්වල බෝම්බ පුපුරවති. එහෙත් කොටියා තහනම් කරන්නට ලංකා රජයට උවමනාවක් නැති. ඊට හේතුව කුමක්දැයි කිසිවෙකුට තේරුම් ගත නොහැකි කාරණයකි. මේ ළඟදී **ටැමිල්නෙට්** වෙබ් අඩවියේ කියා තිබුණොත් කොටි සංවිධානය කිසිදා ලංකාවේ තහනම් නොකරන බවය. උන් එසේ කීවේ ඇයි? අනෙක් අය නොදන්නා උන් පමණක් දන්නා ඒ රහස කුමක් ද?

කොටි තහනමක් ලංකාවේ නැති නිසා කොටින්ට නැති අයිතිවාසිකමක් හා ගරුත්වයක් ශ්‍රීලංකා රජයම දී ඇත. ඒ අනුව කොටියා ලෝකයාට කියන්නේ තමා ශිෂ්ට සම්පන්න සංවිධානයක් බව ය. කොටින්ට පහරදෙන විට ඇතැම් රටවල් ලංකාවට බනින්නේ ඒ නිසා ය. කොටි ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස ලංකාවේ තහනම් කර තිබුණා නම් එවැනි චෝදනාවක් ලංකාවට නො ඒ. ලෝකයේ ඕනෑම සෛවරී නිදහස් රටකට තමරට සතුරන්ගෙන් ආරක්ෂා කරගන්නට යුදවදින්නට සතුරා වනසා සුන්නද්ධූලිකර දමන්නට අයිතියක් ඇත. කොටින්ට අනවශ්‍ය ගරුත්වයක් දී උන් මහා කෙරුම්කාරයින් ලෙස ලෝකයාට පෙන්නන්නේ ලංකා රජයමයි. ඔලුව අතගා අං ඇත්දැයි බලනු වටී.

# ඇසළ මහිමය

**ඇ**සළ යන වචනය බිහිව ඇත්තේ **ඇස්** සහ **හළ** යන වචන දෙක සන්ධිවීමේදී **හළ** යන්නේ මුලට එන **හ** කාරය ලොප්වී **හළ** යන්න **අළ** යන්න බවට පත්වීමෙනි. එවිට **ඇස් + අළ = ඇසළ** බවට පත්වේ.

**අල** යනුවෙන් ලිහිල් වන **හළ** යන්නෙහි තේරුම විවෘත කරන ලද නොහොත් අරින ලද යන්නයි. පැරණි පොතපතෙහි එන **හළ දොරින්** යන යෙදුමෙහි තේරුම **විවෘත කරන ලද** නොහොත් **අරින ලද** යන්නයි. ඒ අනුව **ඇසළ** යන්නෙහි තේරුම **ඇස් ඇරිය** නොහොත් **ඇස් හැරිය** යන්නයි.



එම නිසා ඇසළ මහ මහිමය යනු ඇස් ඇරීමේ මහා මහිමයයි. **ඇසළ මස** යනු **ඇස් ඇරිය මාසයයි.**

බෞද්ධ ඉතිහාසයෙහි ඇසළ පුන් පොහෝ දින සිදුවූ මහා මහිමය වන්නේ බුදුහිමියන්ගේ ප්‍රථම ධර්ම දේශනාව වන ධර්මධම්මචක්කපවත්තන සූත්‍රය ඇසූ කොණ්ඩඤ්ඤ තවුසාණන්ගේ නුවණ නමැති ඇස ඇරීම නොහොත් නුවණැස පැදීමයි. එසේ පැදුණු ප්‍රඥා චක්ෂු නමැති නුවණැස හැඳින්වීම සඳහා ධම්මචක්කපවත්තන සූත්‍රයේදී බුදුන්වහන්සේ යොදාගන්නා ලද්දේ ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං ධම්මචක්ඛු උදපාදි යන පාඨයයි. එයින් කියැවෙන්නේ කොණ්ඩඤ්ඤ තවුසාණන් තුළ කෙළෙස් මලින් තොර සුපිරිසිදු දහම් ඇස පහළ වූ බවයි. ඒ දහම් ඇස කුමක් ද යන්න පැහැදිලි කරමින් උන්වහන්සේ මෙසේ දෙසූහ. යං කිඤ්චි සමුදය ධම්මං සබ්බංතං නිරෝධ ධම්මන්ති යන පාඨයයි. එහි අදහස ඇතිවන හැම දෙයක්ම නැතිවන බව සපුරා අවබෝධවීම ලෝක ධර්ම ස්වභාවය දකින නුවණැස පහළවීම බවයි. ඇතිවී නැතිවී යන කිසිවක් කෙරේ නොඇලෙන වීතරාගී සිතක් පහළ වන්නේ නුවණැස පැදුණු විටයි.

නැණ හා නුවණ යනු එකම දෙය නොවේ. නැණ යනු ඥානයයි. නුවණ යනු ප්‍රඥාවයි. ඥාණය යනු කාලාන්තරයක් තිස්සේ රැස්කර තබාගන්නා ලද දැනුම් සම්භාරයයි. අතීතයේ සිදුවූ එම මතක සටහන් අයිති වන්නේ මියගිය අතීතයට මිස ජීවමාන වර්තමානයට නොවේ.

ප්‍රඥාව නොහොත් නුවණ යනු මෙම වර්තමාන මොහොතේ තමා තුළින් මතුවන ක්ෂණික අවබෝධයකි. ඇතුළතින් මතුවන්නක් නිසා එම අවබෝධය අන්තර්ඥානය නමින්ද හැඳින්වේ.

ඥාණයේදී අතීත අත්දැකීම් මතක ප්‍රයෝජනයට ගෙන කාලය, දැනුම හා ශ්‍රමය වැයකරමින් තර්කානුකූලව සිතා නිගමනයකට විත් යමක් අවබෝධකරගන්නා අතර, ප්‍රඥාවේදී කාලයත්, ඥානයත්, ශ්‍රමයත් ප්‍රයෝජනයට නොගෙන ක්ෂණික අවබෝධයක් මතුවීමයි.

නිර්වාණාවබෝධය ලබා දෙන ප්‍රඥා චක්ෂුව නොහොත් පැණැස අප හැම තුළම මෝහය සහ අවිද්‍යාව යන අන්ධකාරයන්ගෙන් වැසී සැඟවී පවතී. ඒ නුවණැස පැදී නිවන් දැකිය හැක්කේ ඒ සඳහා අවශ්‍ය වන හේතු සම්පත් මෝරා පරිණත බවට පත්වූ විටයි. එවිට නිවන් මගට යොමුවීම හා නිවන්දැකීම නිරායාසයෙන් සිදුවන්නේය. බුදු හිමියන් වෙසක් පුන් පෝදා බුදුවී තුන්මාසයක් යනතුරා, සිය ප්‍රථම ධර්මදේශනාව ඇසළ පුන් පෝදා වන තෙක් පමාකළේ දහම් ඇස පහළවීමට උපකාර වන පරිදි ස්වාභාවික පරිසරය මුහුකුරා යනතුරු විය යුතුය.

බක්මහ සමග විකසිත වී, වෙසක් මසේ මල් බරව, වසන්ත ශ්‍රීයෙන් බබළා, ඇසල මස වන විට ජරා ජීර්ණව, කොළ හැලී ඉපල් බවට පත්ව, ඇටසැකිළි සේ දිස්වෙමින් ස්වභාවධර්මයේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ලක්ෂණ පහළකරන පරිසරයක බුදුහිමියන්ගේ ප්‍රථම ධර්මදේශනාව පැවැත්වීම අර්ථවත් වූයේ කොණ්ඩඤ්ඤ තවුසාණන් තුළ දහම් දකින නුවණැස අවදිවී සෝවාන් ඵලයට පත්වීමත් සමගය.

කොතරම් ඇසළ මාස පසුවී ගියත් අපට තවම සෝවාන්වීමට වත් නොහැකිව ඇත්තේ ඒ සඳහා අවශ්‍ය අපේ හේතු සම්පත් තවම මුහුකුරා ගොස් නැති නිසා විය යුතුයි.

මාර්ග පල ලැබීම හිතාමතා ඕනෑකමින් හා ආයාසයෙන් කළ නොහැක්කකි. ඒ සඳහා ඊට නිසි පරිසරය හා අවස්ථාව එළඹිය යුතුය. අනෙක කලබල නොවී ඉවසා සිටීම නුවණැත්තාගේ ලක්ෂණයකි. මාර්ගඵල ලැබීමට උත්සාහකිරීම මෝඩකමකි. ආත්මාර්ථකාමී කමකි. සක්කාය දිට්ඨියක් පදනම් කරගත් ක්‍රියාවකි. මගපල ලැබිය හැක්කේ සක්කාය දිට්ඨියත්, ආත්මාර්ථයත් දුරුකර ගැනීමෙනි. ඒ මගපල ලැබීම ස්වාභාවිකව මෙන්ම නිරායාසයෙන් සිදුවන්නකි. දහම් දකින නුවණැස පහළවන ඇසළ මහා මහිමයකි.

♦ ***සම්මානිත මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම*** **Harrow UK**

## The wrong Road

**A** wandering ascetic, having heard of the Buddha, travelled everywhere looking for him. One night he came to stay in a house where the Buddha was also staying but, not knowing the Buddha's physical appearance he was unaware of his presence. The next morning he arose and continued his way, still searching for the Buddha. The search for peace and enlightenment without correct understanding is like this.

Due to lack of understanding of the truth of suffering and its elimination all subsequent factors on the path will be wrong- wrong intentions, wrong speech, wrong actions, and wrong practice of concentration and tranquillity. Your likes and dislikes are not a trustworthy guide in this matter either, although foolish people may take them for their ultimate reference.

Alas, it is like travelling to a certain town - you knowingly start out on the wrong road, and since it is a convenient one, you travel it in comfort. But it will not take you where you want to go.

♦ ***Ven. Achaan Chah***

## ❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

### හිතොපදේශයෙන්

**දුර්ජනො නාර්ජවම්යාති - සෙය්‍යමානොපි නිත්‍යශ:**
**ස්වෙදනාභ්‍යඤ්ජනොපායෛ: - ස්වපුච්ඡමිව නාමිතම්**

***අර්ථය :*** ***දුදනා නිතර ඇසුරු කළත් අවංකභාවයට නොයෙත්. තෙල් ගැල්වීම පිරිමැදීම යන උපාය වලින් දිගහැරීමට උත්සාහ කරන ලද නැමී ඇති බලුවලිගය මෙනි.***

**ඒ**දිනෙදා ජීවිතයේදී තම තමන්ට හමුවන අය අතර අවංක මෙන්ම වංක පුද්ගලයින්ද එමට සිටිය හැකිය. සියයක් වූ අවංක පුද්ගලයින්ගෙන් පැමිණෙන යම් යම්සුළු කරදර වලට වඩා වංක එක පුද්ගලයෙකුග් එක වැරැද්දකින් මහත් හානියක් සිදුවිය හැකිය. ඒ නිසා පුද්ගලයින් ආශ්‍රය කිරීමේදී ඔවුනොවුන්ගේ වංක හා අවංක බව මැන බැලීම තම තමන්ට පැවරෙන වගකීමකි.

උපදේශ සාහිත්‍යයේ එන උපමා කතාවක අහුඹු ලෙස පැමිණෙන මිතුරන් එකවරම විශ්වාස කොට ලංකරගැනීම සමහර විටෙක මහා විනාශයකට මුල විය හැකි බව සඳහන් කරයි.

ගිජු ලිහිණින් වසන බෙන සහිත විසාල ගසක උන් කෑම සොයා බැහැරට යනවිට පැටවුන් රැකගැන්ම පැවරුණේ අන්ධ වූ එක් මහළු ගිජුලිහිණියෙකුටය. මේ ගැන ඉව වැටුණු එක් බළලෙක් දිවා කාලයේ මහළු ගිජුලිහිණියා හමුවී මිත්‍රවීමට යෝජනා කළේය. නමුත් බළලුන්ගේ ස්වභාවය දත් අන්ධ ගිජුලිහිණියා එම යෝජනාව ප්‍රතික්ෂෙප කළේය. එයින්ද නතර නොවූ බළලා උපායකින් ඔහු රැවටිය හැකියයි සිතා තමන් දැන් මහළු නිසා ප්‍රාණඝාතාදී පව් නොකොට, පෙහෙවස් සමාදන්ව, ඉතා පිරිසිදු ජීවිතයක් ගතකරන බව ඒත්තු ගැන්වීය. බළලාගේ චාටු බසට රැවටුණු මහළු ගිජුලිහිණියා ඔහු හා මිත්‍ර වූවේය. ඉන්පසු දිනපතාම එහි යන බළලා හෙමින් සැරේ වරකට එකා බැගින් ගිජුලිහිණි පැටව් ඩැහැගෙන ඇවිත් මරාගෙන කෑවේය. පැටවුන් එක එකා අඩුවන බව තේරුම් ගත් ගිජුලිහිණින් වරදකරු ලෙස නම් කළේ පැටව් බලාගත් අන්ධ මහළු ගිජුලිහිණියාය.

බෞද්ධ සාහාත්‍යයට අනුව වංක පුද්ගලයා අසත්පුරුෂයෙකු ලෙස නම් කෙරේ. ඊට අනුව ඔහු පරණ තුවාලයක් වැනි සිත් ඇති වහා කිපෙන සුළු කෙනෙකි. කෙනෙකුගේ සුළු වරදකදී පවා ඔහු කිපෙයි. අනුන් හා ගැටෙයි. වහා වෙනස් වෙයි. දැඩි වෙයි. කෝපය, ද්වේශය, නොසතුට පළකරයි. පරණ තුවාලයක් කොට කැල්ලක හෝ ගල්කැටයක හෝ ගැටීමෙන් පැරී බොහෝ සේ ලේ සැරව ගලන්නාක් මෙනි. වංක වූ අසත් පුරුෂයා අනුනට අප්‍රිය අමනාප අහිතක දේම කරයි.

ඉහත සඳහන් පද්‍යයට අනුව වංක පුද්ගලයා කොපමණ කලක් ආශ්‍රය කළත් ඔහුගේ එම වංකගතිය කෙසේවත් ඔහු අත්හරින්නේ නැත. මේ සඳහා යොදන උපමාව නම් බලු වලිගයයි. බොහෝ කලක් තෙල් ගා පිරිමැද කෙනෙකු මෙය දිගහැරීමට වෙහෙස වුවත් නැමී වංකවූ එහි සෘජුවීමක් කිසිදා දක්නට නොලැබේ.

තමන්ට අයත් දෙයක් සොරකම් කළේ යයි දිනක් වෘකයෙක් නරියෙකුට චෝදනා කළේය. නරියා තමා ඒ දේ කළේ නැතැයි කීය. ආරවුල දිග්ගැසුණු නිසා එය විසඳීමට රිළවෙකුට පැවරිණ. සාක්ෂි විමසා රිළවා තීන්දුව දුන්නේ මෙසේය. වෘකයාගේ බඩු නැතිවුනාය කියලා මම හිතන්නේ නැහැ. ඒවගේම නරියා හොරකම් කළේ නැතියි කිව්වත් මම ඒ කීම විස්වාස කරන්නේ නැහැ.

මෙම කතාපුවතින් කියන්නේ හැමවිටම නරියා පිළිගැනෙන් නේ කපටිකමින් පිරුණු වංක කෙනෙකු ලෙසයි. ඒ නිසා වංක කෙනෙකුගේ අවංකභාවයට වුවද පිළිගැනී මක් නොලැබේ. එහෙයින් වංක පුද්ගලයින් වංක ලෙසත්, අවංක පුද්ගලයින් අවංක ලෙසත් හඳුනාගැන්මේ ශක්තිය ඔබට තිබිය යුතුයි. නොඑසේ නම් ඔබ වංකයින්ගේ කපටි ප්‍රයෝගවලට නිරතුරුවම අසුවන්නේය.



♦ **පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි**
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**
**The Avenue, London W4**

**ANOOMA & HEGODA**
**Solicitors**
**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772**
**Colombo Office**
Visa Refusals
Property Purchase in Sri Lanka
**Hegoda & Hegoda**
100/6 Rosemead Place
Colombo 7
Tel. 2672432 / 0777686632